# වැවිලි අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
# තේ පර්යේෂණ මණ්ඩලය
# ඇබෑර්තු

තලවකැලේ පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ, පහත සඳහන් ඇබෑර්තු / තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. කළමනාකාර සහකාර (ගබඩා භාරකරු)

**තනතුරට අදාළ වගකීම් :**

ආයතනයේ කළමනාකරණ හා තාක්ෂණික වැඩ කටයුතු සාක්ෂාත් කර ගැනීම සඳහා ගබඩා කටයුතුවල හා එකී ක්‍රියාවලියේ වගකීම දරමින් ඊට පහසුකම් සැපයීම හා සහායවීම.

**බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් :**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත, තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) හී 5 වන මට්ටමට වඩා පහළ නොවන ගබඩා කළමනාකරණය හෝ ඊට අදළ වෙනත් ක්ෂේත්‍රයක් පිළිබඳව වන නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වැටුප් තලය :**

MA 2-2 (2016) රු. 30,310-10x300-7x350-4x600-20x710 - 52,360/-

**වයස් සීමාව :**

අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් හට ඉහළ වයස් සීමාව බලනොපානු ඇත.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

තරගකාරී ලිඛිත පරීක්ෂණයකින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 02. තාක්ෂණික නිලධාරී (සිවිල්)

**තනතුරට අදාළ වගකීම් :**

ආයතනයේ, කළමනාකරණ හා තාක්ෂණික වැඩ කටයුතු සාක්ෂාත් කර ගැනීම සඳහා සිවිල් වැඩ කටයුතු වල හා එකී ක්‍රියාවලියේ වගකීම දරමින්, ඊට පහසුකම් සැපයීම හා සහායවීම.

**බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් :**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත, තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) හී 5 වන මට්ටමට වඩා පහළ නොවන, සිවිල් වැඩ කටයුතු පිළිබඳව වන නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වැටුප් තලය :**

MA 2-2 (2016) රු. 30,310-10x300-7x350-4x600-20x710 - 52,360/-

**වයස් සීමාව :**

අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් හට ඉහළ වයස් සීමාව බල නොපානු ඇත.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

තරගකාරී ලිඛිත පරීක්ෂණයකින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 03. තාක්ෂණික නිලධාරී (වැඩ පොළ)

**තනතුරට අදාළ වගකීම් :**

ආයතනයේ, කළමනාකරණ හා තාක්ෂණික වැඩ කටයුතු සාක්ෂාත් කර ගැනීම සඳහා යාන්ත්‍රික (වැඩ පොළ) වැඩ කටයුතු වල හා එකී ක්‍රියාවලියේ වගකීම දරමින්, ඊට පහසුකම් සැපයීම හා සහාය වීම.

**බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් :**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත, තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) හී 5 වන මට්ටමට වඩා පහළ නොවන, යාන්ත්‍රික (වැඩ පොළ) වැඩ කටයුතු පිළිබඳව වන නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වැටුප් තලය :**

MA 2-2 (2016) රු. 30,310-10x300-7x350-4x600-20x710 - 52,360/-

**වයස් සීමාව :**

අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් හට ඉහළ වයස් සීමාව බල නොපානු ඇත.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

තරගකාරී ලිඛිත පරීක්ෂණයකින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 04. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)

**තනතුරට අදාළ වගකීම් :**

ආයතනයේ, කළමනාකරණ වැඩ කටයුතු සාක්ෂාත් කර ගැනීම සඳහා, තාක්ෂණික නොවන මාදිලියේ වැඩ කටයුතු වල හා එකී ක්‍රියාවලියේ වගකීම දරමින්, ඊට පහසුකම් සැපයීම හා සහාය වීම.

**බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් :**

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන්, එක්වර විෂයන් හයකින් (06) සමත් වී තිබිය යුතු අතර, ඉන් භාෂාව (සිංහල / දෙමළ) සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතු වේ.

සහ

අ.පො.ස. (උ/පෙ) විභාගයෙන්, විෂයයන් තුනකින් (03) (පොදු ප්‍රශ්න පත්‍රය නොමැතිව) සමත් වී තිබිය යුතු වේ.

සටහන : සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් පරිගණක කටයුතු (උදා : work processing, spread sheet) කිරීම පිළිබඳ දැනුම හා හැකියාව විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් :**

පහත සුදුසුකම් සපුරාලන, පහළ මට්ටමේ ශ්‍රේණිවල – පුහුණු, අර්ධ පුහුණු හා නුපුහුණු සේවකයින් හටද මේ සඳහා අයදුම් කළ හැකිවේ.

**අධ්‍යාපන :**

අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් විෂයන් හයකින් (06) සමත්ව ඉන්, භාෂාව (සිංහල / දෙමළ) සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ ලබා ඇති අයවළුන්.

**අනෙකුත් :**

ඉහත සේවක ශ්‍රේණි යටතේ වන ස්ථිර තනතුරක, අවු. 05 ක අවම සතුටුදායක සේවකයක් සම්පූර්ණ කොට තිබිය යුතු වේ.

**සටහන :**

ස්ථිර තනතුරකට පත්කිරීමට පෙර යෙදී ඇති සේවා කාලය හෝ ඕනෑම තනතුරක ස්ථිර සේවයට බඳවා ගැනීම සඳහා වන පූර්ව අවශ්‍යතාවයක් ලෙස පුහුණුවීමේ කටයුත්තක යෙදී ඇති සේවා කාලය හෝ ඉහත සඳහන් කොට ඇති පරිදි සුදුසුකම් ලෙස සලකන අවු. 05 ක කාල සීමාව සඳහා ඇතුළත් නොවිය යුතුයි. අනියම් / තාවකාලික පදනම මත වන සේවා කාලයන් ද මෙම කරුණ සඳහා අදළ කරගත යුතු නොවේ.

**වැටුප් තලය :**

MA 1-2 (2016) රු. 27,910-10x300-7x350-12x600-12x710-49,080/-

**වයස් සීමාව :**

අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් හට ඉහළ වයස් සීමාව බල නොපානු ඇත.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

තරගකාරී ලිඛිත පරීක්ෂණයකින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**අනිකුත් ප්‍රතිලාභ**

(i) නවාතැන් පහසුකම් (සම්පූර්ණ ගෘහ භාණ්ඩ සහිත නිවාස / නේවාසිකාගාර කාමර) පවතිනම් සපයනු ලබන අතර එසේ නොමැති නම් ඒ වෙනුවට දීමනාවක් ලබා දෙනු ලැබේ.

(ii) ආයතනයේ පවත්නා වූ වෛද්‍ය යෝජනා ක්‍රමයට අනුකූලව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවේ.

(iii) ආයතනයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍යය ප්‍රවාහන පහසුකම් නොමිලේ සපයනු ලැබේ.

(iv) තලවාකැලේ ශාන්ත කුම්බ්ස් වතුයායේ සිට සෑම සති අන්තයකම කොළඹට හා මහනුවරට ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.

(v) **අර්ථ සාධක අරමුදල් :** තෝරාගත් අයදුම්කරුවන් හට, ඔවුන්ගේ වැටුපෙන් 10% ක මුදලක් සේවකයින් සඳහා වූ අර්ථ සාධක අරමුදලට ගෙවීමට සිදුවන අතර, ආයතනය ඒ සඳහා 15% ක් ලබා දෙයි. ඒ අතර, 3% ක මුදලක් ආයතනය විසින් සේවක භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

(vi) තේ පර්යේෂණ ආයතනයේ සේවකයින්ට හිමි අනිකුත් අමතර ප්‍රතිලාභ හිමිවේ.

මෙකී තනතුරු ස්ථිර පදනම මත වන අතර, උප්පැන්න සහතිකයේ සහ අදළ අධ්‍යාපන, අනිකුත් වෘත්තීය සුදුසුකම් හා සේවා සහතික ඇතුළු සහතිකපත් වල පිටපත් සමගින්, සම්පූර්ණ විස්තරයක් සහිත අයදුම්පතක්, අයදුම්කරු විසින් අදළ ක්ෂේත්‍රයේ ලබා ඇති සුදුසුකම් හා දැනුම පිළිබඳව තක්සේරුවක් සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් ඇතුළත්ව, 2021 නොවැ. 15 වැනි දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත නම් සඳහන් අයගේ ලිපිනයට එවිය යුතු වේ.

රාජ්‍ය සේවයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල ආදියෙහි සේවයේ නියුතු නිලධාරීන් ඔවුන්ගේ අයදුම්පත් අදළ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු වේ. මෙකී අවශ්‍යතාවයන්ට අනුකූලනොවන අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට අවකාශය ඇත. තවද ලියුම් කවරයේ වම් කෙළවරේ උඩ කොටසෙහි, අයදුම් කර ඇති තනතුර සඳහන් කරන්න.

කරුණාකර අවශ්‍ය තොරතුරු සඳහා තේ පර්යේෂණ ආයතනයේ www.tri.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කුම්බ්ස්, තලවාකැලේ.**